RARE

# ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි බලපෑම: සීතාවක ප්‍රාදේශීය සභාව හා බියගම ප්‍රාදේශීය සභාව ඇසුරෙන්

කේ. ඒ. පී. ආර්. කාරියප්පෙරුම

විභාග අංකය - FGS/G/MSSc/2004/05

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1248 |
| වර්ග අංකය: | |

කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨය මඟින් පවත්වන ලද සමාජීය විද්‍යාපති පාඨමාලාවේ අවසාන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනයකි.

ඔක්තෝම්බර් 2016

# සාරාංශය

ශ්‍රී ලංකාවේ පළාත් පාලනයට පැරණි හා මධ්‍යතන යුග දක්වා දිවෙන දීර්ඝ ඉතිහාසයක් තිබුණද, වත්මන් පළාත් පාලන ක්‍රමය බිහිවන්නේ බ්‍රිතාන්‍ය පරිපාලනය විසින් 1865 අංක 17 දරණ මහා නගර සභා ආඥා පනත මගින් කොළඹ මහා නගර සභාව සහ මහනුවර මහා නගර සභාව ස්ථාපිත කිරීමත් සමඟය.

මහජනයාට වඩාත් සමීපතම පාලන ඒකකය වශයෙන් පළාත් පාලන ආයතනවලට මහජන සෞඛ්‍යය සනීපාරක්ෂාව, සමාජ, ආර්ථික හා යටිතල පහසුකම් වර්ධනය පිළිබඳ මූලික වගකීම් පැවරී ඇත. පළාත් පාලන ආයතනවලට පවරා ඇති බලතල තුළ අදාල කාර්යයන් සිදු කළ හැක. පළාත් පාලන ආයතන තම සේවාවන් කාර්යක්ෂම හා ඵලදායීව සිදුකිරීමට උත්සහ දරන අතරම, නෛතිකව පැවරී ඇති වගකීම් ඉටුකිරීමේදී අභියෝග රාශියකට මුහුණදී සිටී.

බොහෝ පළාත් පාලන ආයතන සේවාවන් සැපයීමේදී ප්‍රධාන වශයෙන් කළමනාකරණ ගැටළු, මූල්‍ය ගැටළු හා අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමේ ගැටළුවලට මුහුණදී සිටී. එය මහජනයා පළාත් පාලන ආයතන වෙත තබා ඇති විශ්වාසය බිඳ දැමීමට හේතු වී ඇත. සම්පත් හිඟය හා අකාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රමුඛ කාර්යයක් ඉටුකිරීමට පළාත් පාලන ආයතන සමත්ව නැත.

යල් පැනගිය නීති රාමුවක් වුවද, පළාත් පාලනයේ නෛතික පද්ධතිය ඉතා පුළුල් වූවකි. වර්තමානයේදී පළාත් පාලනය නව මාවතකට යොමු වෙමින් පවතින බැවින්, එම ආයතන සඳහා නව ශක්තියක් හා ජවයක් ලබාදීමට හැකි ගතික පළාත් පාලන ක්‍රමවේදයක් සකස් කළයුතු ව ඇත.

Impact of Local Authorities of Sri-Lanka for Regional Development: Based on Biyagama Pradeshiya Sabha and Seethawake pradeshiya Sabha.

Summary

Although Sri -Lanka's Local Government has a long history which goes back to the ancient and mediaeval periods, the present form of local Government was introduced during the British administration with the establishment of the Colombo and Kandy Municipal Councils by ordinance No 17 of 1865.

The Local Authorities are empowered to carry out certain functions and are not empowered to exercise powers beyond the given scope.

Local Government, as the governance sphere closet to the people, has a profound impact on the day to day lives of citizenry, particularly in the areas of their health and sanitation, social and economic infrastructure and development prospects available to them.Despite major efforts to promote sustainable, efficient and effective Local Government functions in different fields, The Local Government bodies in Sri -Lanka still face enormous challenges in fulfilling their statutory role. The majority of Local Authority have fallen short of expectations and the growing discontent with the backlogs in service delivery, deficit in public management, lack of coordination between different actors and poor fiscal performance have led to decline in the trust the citizenry has in Local Authority Administration.

It is weak in resources, not effective in management and does not play and outstanding role in the mainstream of development.

Although outdated the local framework on Local Government is broad .Local Government is at cross roads at present.There for it needs strength and vigor to function as a dynamic system of Governance.